# විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

කොමිෂන් සභා චක්‍රලේඛ අංක: 07/2017

අංක 20, වෝඩ් පෙදෙස
කොළඹ 07.

2017 පෙබරවාරි මස 20වන දින.

විශ්වවිද්‍යාල උපකුලපතිවරුන්
මණ්ඩපාධිපතිවරුන්
ආයතන අධ්‍යක්ෂවරුන්

පරිගණක යෙදුම් සහකාර III ශ්‍රේණිය, II ශ්‍රේණිය, I ශ්‍රේණිය, මාණ්ඩලික සහකාර ( පරිගණක යෙදුම්) සහ ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික සහකාර (පරිගණක යෙදුම්) තනතුරු සඳහා වන බඳවා ගැනීමේ පරිපාටි

2013.12.20 දිනැති ආයතන චක්‍රලේඛ ලිපි අංක 17/2013 හා 2015.09.17 දිනැති කොමිෂන් සභා චක්‍රලේඛ අංක 12/2015 මඟින් සංශෝධිත 2002.07.03 දිනැති කොමිෂන් සභා චක්‍රලේඛ අංක 804 න් නියම කර ඇති ඉහත තනතුරුවලට බඳවා ගැනීමේ පරිපාටිය කෙරෙහි ඔබගේ අවධානය යොමු කෙරේ.

02. 2017.02.02 දින පැවැති කොමිෂන් සභාවේ 958 වන සභා වාරයේ දී, ආයතන චක්‍රලේඛ ලිපි අංක 2013/17 ට අනුව පරිගණක යෙදුම් සහකාර III ශ්‍රේණියේ තනතුරු දරන්නන් II ශ්‍රේණියට උසස් වීම සඳහා ලිපිකරු හා සමාන්තර ශ්‍රේණිවල සේවකයන් සඳහා පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයට පෙනී සිටීමට අවශ්‍ය බව සැලකිල්ලට ගෙන, පරිගණක යෙදුම් සහකාර I ශ්‍රේණිය සහ මාණ්ඩලික සහකාර (පරිගණක යෙදවුම්) යන තනතුරු සඳහා පවත්නා බඳවා ගැනීමේ පරිපාටිවල බඳවා ගැනීමේ ක්‍රමය යටතේ සඳහන් කර ඇති "පරීක්ෂණය", එකී ආයතන චක්‍රලේඛ ලිපි අංක 17/2013 ට අනුව II ශ්‍රේණියට උසස් වීම සඳහා ලිඛිත පරීක්ෂණයට පෙනී සිටීමේ අවශ්‍යතාවයට ලක් වූ III ශ්‍රේණියේ පරිගණක යෙදුම් සහකාර තනතුරුදරන්නන්ගේ පළමු කණ්ඩායමේ සිට ක්‍රියාත්මක වන පරිදි ඉවත් කිරීමට තීරණය කරන ලදී.

03. එසේ වුවද, දැනටමත් කොමිෂන් සභා චක්‍රලේඛ අංක 804 හි නියම කර ඇති බඳවා ගැනීමේ පරිපාටි ප්‍රකාරව පරිගණක යෙදුම් සහකාර II හා I ශ්‍රේණිවලට උසස්වීම් ලබා සිටින්නන්, ඔවුන්ගේ ඊළඟ ආසන්නතම උසස්වීම වන, අදාල පරිදි, පරිගණක යෙදුම් සහකාර I ශ්‍රේණිය/ මාණ්ඩලික සහකාර (පරිගණක යෙදුම්) තනතුර සඳහා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 804 හි දී ඇති බඳවා ගැනීමේ ක්‍රමයට ම අනුව සලකා බැලිය යුතුය. එම සේවකයින් සම්බන්ධයෙන් ඉන් අනතුරුව යෙදෙන, උසස්වීම /උසස්වීම්, ඉහත 2 ඡේදයේ සඳහන් තීරණයට අනුව, අදාල පරිදි, සම්මුඛ පරීක්ෂණය හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය මඟින් සලකා බැලිය යුතුය.

04. කරුණාකර ඒ අනුව කටයුතු කරන්න.

අත්/කළේ මහාචාර්ය මොහාන් ද සිල්වා

සභාපති

පිටපත්:

1. ලේකම් / උසස් අධ්‍යාපන සහ මහාමාර්ග අමාත්‍යාංශය
2. සභාපති කාර්යාලය / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
3. උප සභාපති / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

2 පිටුවට ....

4. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සාමාජිකයන්
5. ලේකම් / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
6. පීඨාධිපතිවරුන්
7. විශ්වවිද්‍යාල ලේඛකාධිකාරිවරුන්
8. ගණකාධිකාරී / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
9. විශ්වවිද්‍යාල මූල්‍යාධිකාරීවරුන්
10. උසස් අධ්‍යාපන ආයතන/ ආයතනවල පුස්තකාලයාධිපතිවරුන්/ ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපතිවරුන් / සහකාර පුස්තකාලයාධිපතිවරුන්
11. උසස් අධ්‍යාපන ආයතන/මණ්ඩපවල නියෝජ්‍ය ලේඛකාධිකාරිවරුන් / ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරිවරුන්/ සහකාර ලේඛකාධිකාරිවරුන්
12. උසස් අධ්‍යාපන ආයතන/මණ්ඩපවල නියෝජ්‍ය මූල්‍යාධිකාරීවරුන්/ ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරීවරුන්/ සහකාර මූල්‍යාධිකාරීවරුන්
13. අභ්‍යන්තර විගණක / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
14. විශ්වවිද්‍යාලවල රජයේ විගණක අධිකාරීවරුන්
15. උසස් අධ්‍යාපන ආයතනවල නියෝජ්‍ය අභ්‍යන්තර විගණකවරුන්/ ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණකවරුන් / සහකාර අභ්‍යන්තර විගණකවරුන්
16. වෘත්තීය සමිති ලේකම්වරුන්
17. විගණකාධිපති

ලිපි ගොනු අංකය : යූජීසි /එච්ආර්/2/3/199

වී/-